ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
Gampaha Wickramarachchi University of Indigenous Medicine, Sri Lanka
கம்பஹா விக்ரமாராச்சி சுதேச மருத்துவப் பல்கலைக்கழகம், இலங்கை

නුවර පාර, යක්කල. | Kandy Raod, Yakkala | கண்டி வீதி, யக்கல.

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My number | GWUIM/NAE/2026/R/I | ඔබේ අංකය<br>Your number | |

**ලේකම්** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**ලේඛකාධිකාරි**
කොළඹ විශ්වවිද්‍යාලය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
කැලණිය විශ්වවිද්‍යාලය
මොරටුව විශ්වවිද්‍යාලය
යාපනය විශ්වවිද්‍යාලය
රුහුණු විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නැගෙනහිර විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය
වවුනියා විශ්වවිද්‍යාලය

**අධ්‍යක්ෂ**
වෛද්‍ය විද්‍යා පශ්චාද් උපාධි ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
විද්‍යා පශ්චාද් උපාධි ආයතනය
කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය
කෘෂිකර්ම විද්‍යා පශ්චාද් උපාධි ආයතනය
පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනය
පාලි හා බෞද්ධ පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාද් උපාධි ආයතනය
වෛද්‍ය විද්‍යා පශ්චාද් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාද් උපාධි ආයතනය
ඉංග්‍රීසි පශ්චාද් උපාධි ආයතනය
මානව සම්පත් අභිවර්ධන ආයතනය
ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය
තාක්ෂණික විද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය
ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උපකුලපති<br>துணை<br>வேந்தர்<br>Vice Chancellor | 033 2215771<br>033 2222739 | ලේඛකාධිකාරි<br>பதிவாளர்<br>Registrar | 033 2215772 | මූල්‍යාධිකාරි<br>தவிசாளர்<br>Bursar: | 033 2223785 | සාමාන්‍ය<br>பொது<br>Genaral | 033 2222748 |

ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය
කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය

**මණ්ඩපාධිපති** ශ්‍රී පාලි මණ්ඩපය
ත්‍රිකුණාමලය මණ්ඩපය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින මේ සමඟ අමුණා ඇති දැන්වීමේ සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීමට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් කැඳවමින් නිකුත් කරන ලද දැන්වීම මේ සමඟ එවමි. මෙම දැන්වීම ඔබ ආයතනයේ සේවක භවතුන්ගේ දැනගැනීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

බී.ඒ.එන්.ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරී
2026.07.28

**පුරප්පාඩු**

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි තනතුරේ තහවුරු කරන ලද **ස්ථිර සේවක භවතුන්ගෙන්** පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://gwu.ac.lk/ මාර්ගගත පෝරමය (Online Form) **2026.07.28** දින **2026.08.18** දින දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://gwu.ac.lk/ වෙබ් පිටුව මඟින් ලබා ගත හැකි අතර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ අයදුම් කිරීමේ උපදෙස් ලබා ගැනීම සඳහා https://gwu.ac.lk/ හි vacancies වෙත පිවිසිය යුතුය.

මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ **<u>සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක්</u>** තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරී/ මණ්ඩපාධිපති/ අධ්‍යක්ෂ මඟින් **2026.08.18** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරී, ආයතන අනධ්‍යයන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුර සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල **සහතික කරන ලද** ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළවිට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බලනු නොලැබේ.

විමසීම් සඳහා රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා 033 2215829 දුරකතන අංකය ඔස්සේ ඇමතිය හැකිය.

<u>වැඩ පරිපාලක (නඩත්තු) - III ශ්‍රේණිය</u>

අවශ්‍ය සුදුසුකම්:

1. (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව, අවස්ථා 2කට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6ක් සමත්වීමෙන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

හෝ

(ආ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6ක් සඳහා අවස්ථා 3කට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 8ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ඉ) 7 වන ශ්‍රේණිය සමත්වීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 15ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. ශ්‍රමිකයින් අධීක්ෂණය කිරීමේ අවම වශයෙන් වසර 3ක පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප් පරිමාණය : රු. 49,475 - 17 x 540 - 58,655 (මසකට) [U-MN1 (III)]

බඳවා ගැනීමේ ක්‍රමවේදය : යෝග්‍යතා පරීක්ෂණයක් (Aptitude test) සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම.

බී.ඒ.එන්.ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරී
2026.07.28